(අන්තර්ජාල අනුවාදය)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 4 දරන බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන පනත)

---

[සහතිකය සටහන් කළේ 1999 මාර්තු මස 10 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 මාර්තු මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 4.50 තැපැල් ගාස්තුව: රු.3.50 යි.

# 1999 අංක 4 දරන බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනත



[සහතිකය සටහන් කළේ 1999 මාර්තු මස 10 වැනි දින.]

එල්.ඩී. – ඕ. 1/98.

**නියාදනය කිරීමට ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් හෝ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් හෝ අදහස් කරනු ලබන ඇතැම් සහාධිපත්‍ය දේපළ පිළිබඳ පිඹුරු ලියාපදිංචි කිරීම පහසු කරලීම සඳහා සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

පූර්විකාව.

“ශ්‍රී ලංකාවේ කැල්වරි දේවස්ථානය” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සමිතියක් ශ්‍රී ලංකාවේ එවැනි දේවස්ථානවල නියෝජිතයන් විසින් පිහිටුවා තිබූ හෙයින් ද, එකී සමිතිය විසින් එකඟ වූ රීති අනුව, ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල ද සමාන ආගමික සභා අතර සහයෝගී සුහදතාව ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා සහ ඒ සමිතියට සම්බන්ධ සියලු කරුණු ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබු හෙයින් ද;

ඒ සමිතිය පිහිටුවන ලද්දේ යම් පරමාර්ත සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන සහ ඉටුකරන ඇති හෙයින් සහ ඒ සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලුම්කර ඇති හෙයින් ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද;

ලුහුණු නාමය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ

ශ්‍රී ලංකා කැන්වරි දේවස්ථානය සංස්ථාගත කිරීම.

1. මේ පනත 1999 අංක 2 දරන ශ්‍රී ලංකාවේ කැල්වරි දේවස්ථානය (සංස්ථාගත කිරීමේ) පත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු “සමිතිය” යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ කැල්වරි දේවස්ථානයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) “ශ්‍රී ලංකාවේ කැල්වරි දේවස්ථානය” යන නාමය හි අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතුය. තවද ඒ සංස්ථාව විසින් හා එයට විරුද්ධව ද එකී නාමයෙන්

සංස්ථාවේ පොදු පර්මාථ.

සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමට ද, එය පාවිච්චි කිරීමට ද, තම කැමැත්ත පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය.

3. සමිතියේ පොදු පර්මාථ සඳහා සඳහන් පරිදි විය යුතු බවට ප්‍රකාශ කරනු ලැබේ

(අ) සංගමයේ ආගමික ප්‍රකාශය පිළිගෙන ඇති සියලු සමාන දේවස්ථාන අතර කාර්ය සාධන සාමාජිකත්වය පිළිබඳ පදනමක් සඳහා ඉඩ කඩ සැලැස්වීම;

(ආ) සංස්ථාවේ පර්මාර්ථ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වේ යයි සලකනු ලබන සෙමනේරි සහ එවැනි වෙනත් ආයතන පිහිටුවීම; සහ

සංස්ථාවේ බලතල

(ඇ) ඉහත කී පරමාර්ථ සියල්ල හෝ ඉන් කිසිවක් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වන ආනුෂංගික අනෙකුත් සියලු ක්‍රියා හෝ දේ කිරීම

සංස්ථාවේ රීති

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදාන හෝ ත්‍යාග ලබා ගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට ඇතුළුව සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්තයක් හෝ ඉටුකර ගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා කිරීමේ ද, කාරණා ඉටුකිරිමේ ද දේවල් සිදුකිරීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

5. (i) සංස්ථාවේ කටයුතු කළමනාකරණ කිරීම සඳහා සහ එහි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ද, සංස්ථාව විසින් කලින් කල සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දීමට හිමිකම ඇති සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතරයෙන්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

(ii) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, සමිතියේ බලපැවැත් වූ රීති මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට මේ පනත යටතේ සංස්ථාව විසින් සාදනු ලැබූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(iii) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් එවැනි රැස්වීමක් දී සහ එවැන ම ආකාරයෙන් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකිය.

(iv) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ වලංගුව පවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ විසින් චංචල හා නිශ්චල දේපල දැරිය හැකි බව.

6. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතු කරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ. උකස් කිරීමේ හැකියාව, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් එකී සියලු දේපළ දරනු ලැබිය යුතුය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය

7. තත් කාර්ය සඳහා සංස්ථාව විසින් බලය දෙන ලද සාමාජිකයන් සභාපතිවරයා සහ විධායක කමිටුවේ තවත් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතුය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

8. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින් ඔවුන් කෙරෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.